IBO IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

M02/149/S(1)

# SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1
# CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1
# CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1

Tuesday 21 May 2002 (afternoon)
Mardi 21 mai 2002 (après-midi)
Martes 21 de mayo de 2002 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- Ne pas ouvrir cette épreuve avant d'y être autorisé.
- Rédiger un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.

**1 පත්‍රය - විවරණ සැපයීම සඳහා ජේද**

**පහත දැක්වෙන ජේද අතුරින් එකක් සඳහා විවරණයක් සපයන්න.**

**1. (අ)**

## දුකට කියන කවි සීපද

පිලේ පැදුර හේනට අරගෙන එනවා
එලා පැදුර මැස්සේ එහි සැතපෙනවා
රටා වියපු අත් දෙක මට සිහි වෙනවා
හිතේ දුකට එනකොට කවි කියවෙනවා

ඉර පායා ඉර අවරට ගියාදෝ
හඳ පායා හඳ අවරට ගියාදෝ
ඇඩූ කඳුළු මූදට එක් වුණාදෝ
ළමා ළපටි තැනා කොයි ගියාදෝ

එගොඩත් බැලීමි එගොඩත් නුඹ නැතේයා
මෙගොඩත් බැලිමි මෙගොඩත් නුඹ නැතේයා
දෙගොඩම බැලිමි දෙගොඩම නුඹ නැතේයා
සිවුපද කියන මම තනියම පැලේයා

එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ
මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ
දෙගොඩ ගොඩින් කොතන ද නුඹ සිටින්නේ

සීත කරන උඳුවප් මහ දුරුත්තේ
සීතල උහුලන්ඩ මට බැරුවා යන්නේ
කැලේ මදුරු මැසි කරදර නොර නැත්තේ
පැලේ ගින්න විතරයි තනියට ඇත්තේ

උඹේ කරට මල් මාලා ගොතන්නට
මිදු මල් පිපෙනවා හේනේ වැට දිගට
උඹේ කටින් ගී සීපද අහන්නට
නවමත් ගිරවු එනවා පෙර පුරුද්දට

අනේ ගිරවුනේ මා බස අසාපන්
නහා සිටින තැන කොතැන ද සොයාපන්
පැලේ තනිව මා ඉදිතෙයි කියාපන්
හිතේ දුකට නිදි නැතිවා කියාපන්

**මිහගම සේකර**, **නූතන පද්‍ය සංග්‍රහය**, 1995

- මෙම පද්‍ය පන්තියෙහි කථිකයා පිළිබඳ සිත්තම ඉදිරිපත් කර ඇති ආකාරය පරීක්‍ෂා කරන්න.
- එය ඔහු කෙරෙහි පාඨකයා ගේ ආකල්පය සම්බන්ධයෙන් කෙසේ බලපායි ද?
- පාඨයෙහි මනෝභාව ජනනය සඳහා කවියා භාවිත කරන රචනෝපක්‍රම පිරික්සන්න.
- මේ කවිපෙළ ඔබේ සිත් ගනිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

1. **(ආ)**

අපි ඔහු සොහොන් බිමට ඇරලූයෙමු. තමබොචි යුසානයට, ම පියාණන්ගේ වළ ගාවට. මේ වර මා සමග සියලු දෙන ම ආහ. හිදෙජි සං හා මොමොකොත්, කිමිකො චං හා චියෙකොත්. කුඩා යුකිකො චං පවා. දෙවෙන්දෙරා සං ඇරලන්ට සියලු දෙන ම ආහ.

මේ වර පිටත් වන්ට පෙර තක්සිය ගාවට මා ඇරලන්ට යයි මම ඔහුට නොකීවෙමි. මම දිරි ගෙන හුන්නෙමි, ඔහු යන තෙක්. මේ වර ඔහු පෙරළා එන බව මම සැක නැතිව ම දනිමි. මා ඔහු ඇරලූයේ තකජිමා සොහොනට ය. මගේ පරම්පරාවේ සොහොනට ය. ඉන් ඔබ්බෙහි ම පියාණෝත් ඥාතිහුත් වෙසෙති. ඔහුන්ගේ සහව්‍යතාවට ය ඔහු යන්නේ. කවද නුමුත් ඔවුන් හා කැටුව ඔහු යළි මෙලොවට එන්නේය.

''එතකොට හෙට ඔබ නෑ. ඔබ ඉන්නෙ අද විතරයි. අද දවස හමාර වුණාම හෙට දවස. අදත් හෙටත් දෙක ම එකයි. අද අපි දෙන්න ඉන්නව. හෙට මම විතරයි. හෙටත්, අනිද්දටත්, කවදටත් මම විතරයි. මොකක් ද වෙනස? අද වගේ ම හෙටත් කවුරුත් නැගිටිනව, කනව බොනව, වැඩට යනව, කතා බහ කරනව. මාත් මේ ඔක්කොම කරනව. ඒත් මම විතරයි. ඔබ නෑ.''

මම එබඳු වියරු බස් නොදෙඩුවෙමි. එබඳු බස් දෙඩා ඔහු වෙහෙසන්නේ කුමට ද? ඔහු නිසොල්මන් ව සිටී, සිත දැඩි කරගෙන, ආශ්වාස ප්‍රශ්වාස පවා නොකර. ඔහුගේ තීරණය අනිවාර්ය ය. ලෝකයේ ජරා මරණය සේ වෙනස් නොවන නියත ධර්මතාවකි ඒ.

''තව කල් දැම්මත් කවද හරි යන්න එපාය? මොකොට ද කල් දලා? ඉක්මනින් ගිය තරමට ඉක්මනින් එන්න පුළුවන්.''

ඔහුගේ දෙතොලින් මෙබස් කොඳුරන්නා සේ මට දැනුණි. යළිත් ආ හැකි නිසා නොවේ ද ඔහු යන්නේ? නොගියොත් යළිත් ආ නොහැකි ය. යාම හොඳයි. ගොස් ඊම ද හොඳයි. ලොවැ ඇත්තේ යාම ඊම ය. නැවිත් යන්ට බැරි ය. නොගොස් එන්ට බැරි ය.

දැන් මා පතමින් සිටින්නේ මළවුන්ගේ අවුරුදු ද නොපමාව පැමිණේවා කියා ය. මේ වර ඔහු රඳවාගත නොහැකි නම් මම ඔහු කැටුව යන්ට සැරසෙන්නෙමි. මළවුන්ගේ අවුරුදු ද මගේ ආසා නුසුන් කොට එන බව මම දනිමි.

**එදිරිවීර සරච්චන්ද්‍ර, මළවුන් ගේ අවුරුදු දා**, 1965

- මෙම පාඨයෙන් හෙළි වන පරිදි කථිකයා හා මියගිය තැනැත්තා අතර වූ සම්බන්ධතාව ගැන ඔබේ අදහස් දක්වන්න.
- මේ අවස්ථාව පිළිබඳව කවර හැඟීම් පාඨකයා තුළ හටගනී ද?
- ඒ සඳහා ලේඛකයා භාවිත කරන භාෂාව හා රචනෝපක්‍රම පරීක්ෂා කරන්න.
- මේ වර්ණනය ඔබේ සිත් ගනී ද? ඔබේ නිගමනයට හේතු දක්වන්න.